# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,126 - 2019 මැයි මස 31 වැනි සිකුරාදා - 2019.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1452 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1455 |

*සැ. යු.*-(i) ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2019 මැයි මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ශ්‍රම වාසනා අරමුදල (සංශෝධන) පනත් කෙටුම්පත 2019 මැයි මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 ජූනි මස 21 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ජූනි මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1449 - B 81527— 5,403 (2019/05)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය ඃ**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුලත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## තනතුරු - ඇබෑර්තු

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ.)

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2019 ජූලි මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 මැයි මස 13 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගාල්ල | ගාල්ල කඩවත් සතර | ගාල්ල දිස්ත්‍රික් කොට්ඨාසයේ ගිංතොට ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |
| ගාල්ල | ගාල්ල කඩවත් සතර | ගාල්ල දිස්ත්‍රික් කොට්ඨාසයේ කුරුඳුවත්ත/ගිංතොට ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |

05-821

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු — ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2019 ජූලි මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 මැයි මස 13 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගාල්ල | නියාගම | මත්තක කොට්ඨාසයේ උප්පැන්න මරණ හා බෙන්තර වලල්ලාවිට කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |
| ගාල්ල | නියාගම | පිටිගල කොට්ඨාසයේ උප්පැන්න මරණ හා බෙන්තර වලල්ලාවිට කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |
| ගාල්ල | තවලම | තවලම කොට්ඨාසයේ උප්පැන්න මරණ හා හිනිදුම් පත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |
| ගාල්ල | නෙළුව | හප්පිටිය කොට්ඨාසයේ උප්පැන්න මරණ හා හිනිදුම්පත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ගාල්ල | ගෝනාපීනුවල | ගෝනාපීනුවල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |

05-820

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — අනුරාධපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ.)

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2019 ජූලි මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 මැයි මස 08 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| අනුරාධපුරය | තලාව | නුවරගම් පළාත කොට්ඨාසයේ කටියාව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය. |

05-823

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ විවාහ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය සංශෝධනය කිරීම - හම්බන්තොට දිස්ත්‍රික්කය

අංක 2103 හා 2018.12.21 දිනැති *ගැසට් පත්‍රයෙහි* මවිසින් පළ කරන ලද දැන්වීමෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන විවාහ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2019.06.28 වැනි දින දක්වා දීර්ඝ කරමි.

02. එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බවද කරුණාවෙන් සලකන්න.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| හම්බන්තොට | වීරකැටිය | උතුරු ගිරුවාපත්තුව කොට්ඨාසයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට |
| හම්බන්තොට | ලුණුගම්වෙහෙර | මත්තල වලකඩ කොට්ඨාසයේ උප්පැන්න මරණ හා මාගම්පත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට |

05-819

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමණාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2018 (2019)

රජයේ කාර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අධිකාරී තනතුරෙහි පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් 2019 සැප්තැම්බර් මස කොළඹ දී පැවැත්වීමට නියමිත සීමිත තරඟ විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| යාන්ත්‍රික අධිකාරී | 04 |

1. *වැටුප* :
   1.1 වැටුප් කේත අංකය: MN 3-2016
   1.2 වැටුප් පරිමාණය : රු. 31,040 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 57,550
   මෙම වැටුප් පරිමාණයට අදාළව වැටුප් ගෙවනු ලබන්නේ 2020.01.01 දින සිට වන අතර, එදින දක්වා ගෙවීම සිදු කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 උපලේඛනය ii හි විධිවිධානයන්ට යටත්ව ය.

2. බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

3. අධ්‍යාපන සුදුසුකම් : සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයන්ට සම්මාන සාමර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අ. පො. ස. (සා.පෙළ) විභාගය විෂයන් හයකින් (06) සමත් ව තිබීම.

4. *වෘත්තීය සුදුසුකම්* : ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

හා

(I) මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

(II) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව

හෝ

(III) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව,

හෝ

(IV) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව,

හෝ

(V) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන යාන්ත්‍රික ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම,

හෝ

(VI) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

(VII) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමානයැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

5. *කායික සුදුසුකම්* : සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

6. *වෙනත් සුදුසුකම්* :

I. තනතුරට අදාළ ක්ෂේත්‍රයක ප්‍රාථමික ශිල්පීය හෝ ඉන් ඉහළ සේවා ගණයක වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ දෙපාර්තමේන්තුගත නිලධාරියෙකු වීම.

II. නියමිත දිනට පූර්වාසන්න රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබීම.

III. සේවයට බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ නිලධාරියා සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

7. *බඳවා ගැනීමේ ක්‍රමය* :

ඉහත සුදුසුකම් සපුරා ඇති දෙපාර්තමේන්තු සේවකයන් දෙපාර්තමේන්තු පරීක්ෂණයක ප්‍රතිඵල මත පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කෙරේ. වසරක පුහුණු කාල සීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගය සමත්වීම සඳහා විෂයයන් තුනටම සමත් ලකුණු සීමාව ඉක්මවා ලකුණු ලබා ගැනීමෙන් අනතුරුව සම්මුඛ පරීක්ෂණයකට ලක් කිරීමෙන් පසු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියට පත් කෙරේ.

8. 8.1 ලිඛිත විභාගය :

| *විෂය අංකය* | *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 1 | කාර්මික දැනුම | පැය 01 | 100 | 40 |
| 2 | සාමාන්‍ය දැනුම | පැය 01 | 100 | 40 |
| 3 | බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

8.2 ලිඛිත විභාගයේ විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| 1. කාර්මික දැනුම | ❖ වාත්තු, යන්ත්‍රණය, වෑද්දුම්කරණය, මෝටර් කාර්මික, වඩු කාර්මික හා නඩත්තු යන ක්ෂේත්‍රවලට අදාළව බඳවා ගැනීමේ සුදුසුකම් ලෙස දක්වා ඇති ඩිප්ලෝමා හෝ සමාන සහතිකලාභියකු සතුව පැවතිය යුතු තාක්ෂණික දැනුම් මට්ටම පරීක්ෂා කරන ආකාරයේ ප්‍රශ්න ඇතුලත් වේ. |
| 2. සාමාන්‍ය දැනුම | ❖ ලංකාවේ භූ විෂමතා, ඉතිහාසය, දේශපාලනය, ක්‍රීඩා හා මෑත කාලයේ සිදු වූ වැදගත් සිදුවීම් (ජාත්‍යන්තරයේ ලබාගත් ජයග්‍රහණයන් ද ඇතුළුව)<br>❖ ලෝකයේ සිදුවූ වැදගත් සිදුවීම්, භූගෝලීය අනුව සිදුවන බෙදීම්, ප්‍රධාන නගරයන්, ජාත්‍යන්තර සංවිධාන හා ඒවායේ කාර්යභාරයන් |
| 3. බුද්ධි පරීක්ෂණය | ❖ අවබෝධ කර ගැනීමේ ශක්තිය, තර්කානුකූල විචාර බුද්ධිය, විඥාන ශක්තිය ක්ෂණිකව නිවැරදි තීරණ ගැනීමේ හැකියාව, සංඛ්‍යානමය හා ගණිතමය ගැටලු විසඳීමේ හැකියාව, භාෂා බන්ධ, වගු, පින්තූර, ප්‍රස්ථාර උපයෝගී කර ගැනීම හා පරීක්ෂා කිරීම යනාදිය පිළිබඳව දැනුම පරීක්ෂා කෙරේ. |

8.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

9. ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත්‍රයේ අංක 01 සිට 08 තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවට ද අංක 09 සිට 12 දක්වා ශීර්ෂ දෙවන පිටුවට ද ඉතිරිය 03 පිටුවට ද ඇතුළත් වන පරිදි අයදුම්පත්‍රය සකස් කළ යුතු අතර විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත භාෂා මාධ්‍යයෙන් තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහලයට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. එසේ සම්පූර්ණ කරන ලද 2019.06.28 දින හෝ එදිනට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එබැවින් අයදුම්පත්‍රය ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් විභාග ගාස්තුව ගෙවීමට අදාළ ලදුපත අයදුම්පතෙහි නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා ඇත්ද යන්න පිළිබඳවත් විමසිලිමත් විය යුතුය. අයදුම්පතෙහි හා විභාග ගාස්තුවට අදාළ මුදල් ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

10. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

11. විභාග ගාස්තුව රු. 600.00 කි. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් / උප තැපැල් කාර්යාලයක් හෝ දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් හෝ වෙත මුදලින් ගෙවා අයදුම්කරු නමින් ලබාගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලබන අතර ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

12.

12.1 ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු ඇතුලත් කර ඇති අයදුම්පත් හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03 ක් ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේනම් දන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය, නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ලග තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

12.2 අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

13.

13.1 ඉල්ලුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ " රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා තනතුරු සඳහා බඳවා ගැනීම" යනුවෙන් තමා අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

13.2 විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේ ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

14. අත්සන සහතික කරවා ගැනීම :

- දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් අයදුම්පත් යොමු කළ යුතු අතර නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත නිසි පරිදි අයදුම්පතෙහි අලවා තිබිය යුතුය.
- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාග වලදී අයදුම්කරුගේ අනන්‍යතාවය, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛන වලින් ඕනෑම එකක් පිළිගනු ලැබේ. :-

I. ජාතික හැඳුනුම්පත ;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
III. වලංගු රියදුරු බලපත්‍රය.

14.1 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවරනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

14.2 *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.*-ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගය නීති රීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

14.3 *විභාග ප්‍රතිඵල.*-එක් එක් විෂයයට ලකුණු 40% කට නොඅඩුව ලබාගන්නා අයදුම්කරුවන්ගේ කුසලතා අනුපිළිවෙලට සකස් කළ ප්‍රතිඵල ලේඛනය "අධ්‍යක්ෂ ජනරාල්, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, කොලොන්නාව" වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.resuls.exam.gov.lk වෙබ් අඩවිය ඔස්සේ ප්‍රසිද්ධ කරනු ඇත.

14.4 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර, කිසියම් නොගැලපීමක් හෝ අනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්, (වැඩ ආවරණ)
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව.

2019 මැයි මස 15 වැනි දින,
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව,
කොලොන්නාව පාර, කොලොන්නාව.

ආදර්ශ ඉල්ලුම්පත්‍රය

**රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ යාන්ත්‍රික අධිකාරී තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2018 (2019)**

(Limited Competitive Examination for Recruitment to the Post of Mechanical Superintendent in Supervisory Management Assistant - Technological Service Category in the Department of Government Factory) - 2018 (2019)

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි

1. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය : ☐

සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2. අයදුම්කරුගේ නම :

2.1 මුලකුරු සමග නම :
I. සිංහලෙන් / දෙමළෙන් :————.

II. ඉංග්‍රීසියෙන් (IN BLOCK LETTERS) :————.
උදා :- (SILVA, A. B. C. D.)

2.2 මුලකුරුවලින් හැඳින්වෙන නම් ඃ
I. සිංහලෙන් / දෙමළෙන් :————.

II. ඉංග්‍රීසියෙන් (IN BLOCK LETTERS) :————.

3. විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය ඃ
I. සිංහලෙන් / දෙමළෙන් :————.

II. ඉංග්‍රීසියෙන් (IN BLOCK LETTERS) :————.

4. ජාතික හැඳුනුම්පත් අංකය ඃ

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

5. ස්ත්‍රී / පුරුෂ භාවය ඃ පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුල ලියන්න)
ස්ත්‍රී - 1

6. ලිපිනය ඃ
I. පෞද්ගලික ලිපිනය :————.

II. දිස්ත්‍රික්කය :————.

7. දුරකථන අංකය ඃ පෞද්ගලික :————.

8. උපන් දිනය ඃ වර්ෂය ඃ මාසය ඃ දිනය ඃ

9. විවාහක / අවිවාහක බව :————.

10. අධ්‍යාපන සුදුසුකම් ඃ

I. අ. පො. ස. (සා/පෙළ) විභාගය ඃ

විභාග අංකය :————. වර්ෂය :————. මාධ්‍යය :————.

| සමත් වූ විෂයයන් | ශ්‍රේණිය | සමත් වූ විෂයයන් | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10 | |

II. අ. පො. ස. (උ/පෙළ) විභාගය ඃ

විභාග අංකය :————. වර්ෂය :————. මාධ්‍යය :————.

| සමත් වූ විෂයයන් | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

11. වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :

| අනු අංකය | පාඨමාලාවේ නම | ආයතනය | කාල සීමාව | ප්‍රතිඵල |
|---|---|---|---|---|
| 01. | | | | |
| 02. | | | | |
| 03 | | | | |

12. වෙනත් සුදුසුකම් :————.

13. දැනට කිසියම් තනතුරක් දරන්නේනම් ඒ පිළිබඳ විස්තර :
   I. තනතුර හා ශ්‍රේණිය :————.
   II. පත් වූ දිනය :————.
   III. ආයතනය :————.
   IV. විශ්‍රාම වැටුප් සහිත තනතුරක් ද යන වග :————.

*අයදුම්කරුගේ ප්‍රකාශය :*

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගැනීමට ලැබුණහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත් කිරීමෙන් පසු අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කල හැකි බවත් මා දනිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. විභාග ගාස්තුව ගෙවීම පිළිබඳ විස්තර :
   14.1 ගෙවා ඇති විභාග ගාස්තුව රුපියල් (අකුරින්) :————.
   14.2 කුවිතාන්සි අංකය :————.
   14.3 නිකුත් කල කාර්යාලය :————.
   14.4 දිනය :————.

ලදුපත නොගැලවෙන සේ එහි එක් දාරයක් මෙහි අලවන්න.
මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ වෙත තබා ගන්න.

15. *ආයතන ප්‍රධානියාගේ සහතිකය :*
   15.1 මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................ මයා / මිය / මෙනවිය .......................... දින සිට මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත් .............................. දිනට පූර්වයෙන් වූ සතුටුදායක පස් අවුරුදු සේවා කාලය සම්පූර්ණ කර ඇති බවත් ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු මෙම දෙපාර්තමේන්තුවේ ඇති වාර්තා ආශ්‍රයෙන් ඒවා නිවැරදි බවත් අදාල දැන්වීම් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති / නැති බවත් නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත් මෙයින් සහතික කරමි.

   15.2 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් විය යුතුය. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට සිදු වේ.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :————.
සහතික කරන්නාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
නිල මුද්‍රාව :————.

05 - 856

## නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

### රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

### රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018(2019)

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් තනතුරුවල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් **2019** සැප්තැම්බර් මස කොළඹ දී පැවැත්වීමට නියමිත විවෘත තරග විභාගය සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අදාළ සුදුසුකම් සපුරාලන අපේක්ෂකයන්ට තනතුරු දෙක සඳහාම ඉල්ලුම් කළ හැක.

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| යාන්ත්‍රික අධිකාරී | 07 |
| සැලසුම් ශිල්පී | 03 |

1. *වැටුප* :
   1.1 වැටුප් කේත අංකය: MN 3-2016
   1.2 වැටුප් පරිමාණය : රු. 31,040 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 57,550/-
   (මෙම වැටුප් පරිමාණයට අදාළව වැටුප් ගෙවනු ලබන්නේ 2020.01.01 වැනි දින සිට වන අතර, එදින දක්වා ගෙවීම සිදු කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 උපලේඛනය ii හි විධිවිධානයන්ට යටත්ව ය.)

2. *බඳවා ගන්නා ශ්‍රේණිය* : III ශ්‍රේණිය

3. *අධ්‍යාපන සුදුසුකම්* :

(අ) ශුද්ධ ගණිතය/ව්‍යවහාර ගණිතය/සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ගණිත විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්වී තිබීම.

සහ

(ආ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමර්ථයක් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වී තිබීම.

4. *වෘත්තීය සුදුසුකම්* :

(i) මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව;

*හෝ*

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව,

*හෝ*

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව,

*හෝ*

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන යාන්ත්‍රික ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;

*හෝ*

(vi) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

(vii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමානයැයි තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

5. *කායික සුදුසුකම්* : සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

6. *වෙනත් සුදුසුකම්* :

I. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුයි.

II. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුයි.

III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින් ම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

7. *වයස* :

7.1 අවම සීමාව : අවු. 18ට නොඅඩු
7.2 උපරිම සීමාව : අවු. 30 නොවැඩි (ඒ අනුව 2001.06.28 වැනි දිනට හෝ ඊට පෙර හා 1989.06.28 වැනි දිනට හෝ පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

8. *බඳවා ගැනීමේ ක්‍රමය* :
ලිඛිත විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

ලිඛිත විභාගයෙන් එක් එක් විෂය සමත් ලකුණු ප්‍රමාණය වන ලකුණු 40 හෝ ඊට වැඩියෙන් ලබාදෙන විෂයයන් 03 ම සමත් වන අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

8.1 ලිඛිත විභාගය :

| | *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *ප්‍රශ්න සංඛ්‍යාව* | *ප්‍රශ්න පත්‍රවල ව්‍යුහය* |
|---|---|---|---|---|---|---|
| 1 | කාර්මික දැනුම | පැය 01යි | 100 | 40 | 10 | කෙටි ප්‍රශ්න |
| 2 | සාමාන්‍ය දැනුම | පැය 01යි | 100 | 40 | 25 | කෙටි ප්‍රශ්න |
| 3 | බුද්ධි පරීක්ෂණය | පැය 01යි | 100 | 40 | 25 | කෙටි ප්‍රශ්න |

8.2 ලිඛිත විභාගයේ විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| කාර්මික දැනුම | ❖ වාත්තු, යන්ත්‍රණය, වෑද්දුම්කරණය, පෑස්සුම්කරණය, මෝටර් කාර්මික, වඩු කාර්මික හා නඩත්තු යන ක්ෂේත්‍ර වලට අදාළව බඳවාගැනීමේ සුදුසුකම් ලෙස දක්වා ඇති ඩිප්ලෝමා හෝ සමාන සහතිකලාභියකු සතුව පැවතිය යුතු තාක්ෂණික දැනුම් මට්ටම පරීක්ෂා කරන ආකාරයේ ප්‍රශ්න ඇතුළත් වේ. |
| සාමාන්‍ය දැනුම | ❖ ලංකාවේ භූ විෂමතා, ඉතිහාසය, දේශපාලනය, ක්‍රීඩා හා මෑත කාලයේ සිදු වූ වැදගත් සිදුවීම් (ජාත්‍යන්තරයේ ලබාගත් ජයග්‍රහණයන් ද ඇතුළුව)<br>❖ ලෝකයේ සිදු වූ වැදගත් සිදුවීම්, භූගෝලීය අනුව සිදුවන බෙදීම්, ප්‍රධාන නගරයන්, ජාත්‍යන්තර සංවිධාන හා ඒවායේ කාර්යභාරයන් |
| බුද්ධි පරීක්ෂණය | ❖ අවබෝධ කර ගැනීමේ ශක්තිය, තර්කානුකූල විචාර බුද්ධිය, විඥාන ශක්තිය, ක්ෂණිකව නිවැරදි තීරණ ගැනීමේ හැකියාව, සංඛ්‍යානමය හා ගණිතමය ගැටලු විසඳීමේ හැකියාව, භාෂා බණ්ඩ, වගු, පින්තූර, ප්‍රස්ථාර උපයෝගී කර ගැනීම හා පරීක්ෂා කිරීම යනාදිය පිළිබඳව දැනුම පරීක්ෂා කෙරේ. |

8.3 *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය* :
ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

9. ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත්‍රයේ අංක 01 සිට 09 තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවටද අංක 10 සිට 13 දක්වා ශීර්ෂ

දෙවන පිටුවටද ඉතිරිය තෙවන හා සිව්වන පිටුවලට ද ඇතුළත් වන පරිදි සකස් කළ යුතු අතර විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත භාෂා මාධ්‍යයෙන් තම අත් අකුරින් ම සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහලයට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. එසේ සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019.06.28 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එබැවින් අයදුම්පත්‍රය ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත්, විභාග ගාස්තුව ගෙවීමට අදාළ ලදුපත අයදුම්පතෙහි නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා ඇත්ද යන්න පිළිබඳවත් විමසිලිමත් විය යුතුය. අයදුම්පතෙහි හා විභාග ගාස්තුවට ආදාළ මුදල් ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

10. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

11. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ ලෙස තොරතුරු ඇතුළත් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද විභාග ගාස්තුව ගෙවීමට අදළ ලදුපත අයදුම්පතෙහි නියමිත ස්ථානයේ නොගැලවන සේ අලවා ඇත්ද යන්න පිළිබඳවත් විමසිලිමත් විය යුතු අතර මුදල් ලදුපතේ ඡායා පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක. නිසියාකාරව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

11.1 *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.*-ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

12. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළකරනු ඇත. නිවේදනය පළවී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් තම ප්‍රවේශපත්‍රය නොලද අපේක්ෂකයෙක් වේනම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශපත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාල නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය'' යනුවෙන් තමා අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

12.1 විභාග ගාස්තුව රු. 600.00 කි. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් / උපතැපැල් කාර්යාලයක් / දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරු නමින් ලබාගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදුඅයකිරීමක් සිදු නොකරනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

12.2 අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

13. අයදුම්පත්‍රයේ ද, විභාගය සඳහා ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ

හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු ලවා සහතික කරගත යුතුය. දැනටමත් රාජ්‍ය ආයතනයක සේවය කරන අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් යොමු කල යුතුය.

14. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලදී අයදුම්කරුගේ අනන්‍යතාවය, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛනවලින් ඕනෑම එකක් පිළිගනු ලැබේ. :-

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු රියදුරු බලපත්‍රය

14.1 විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

14.2 විභාගය පැවැත්වීමට හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවරනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

15. *විභාග ප්‍රතිඵල* :- මෙම නිවේදනයේ 8.1 ඡේදයට අනුව එක් එක් විෂයයට ලකුණු 40% කට නොඅඩුව ලබා ගන්නා අයදුම්කරුවන්ගේ කුසලතා අනුපිළිවෙලට සකස් කළ ප්‍රතිඵල ලේඛනය "අධ්‍යක්ෂ ජනරාල්, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, කොලොන්නාව" වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.reults.exam.gov.lk වෙබ් අඩවිය ඔස්සේ ප්‍රසිද්ධ කරනු ඇත.

16. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර, කිසියම් නොගැලපීමක් හෝ අනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්, (වැඩ ආවර්ණ)
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව.

2019 මැයි මස 15 වැනි දින,
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව,
කොලොන්නාව පාර, කොලොන්නාව.

ආදර්ශ අයදුම්පත්‍රය

**රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමණාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018 (2019)**

(Open Competitive Examination for Recruitment to Posts in Supervisory Management Service - Technological Service Category in
the Department of Government Factory) - 2018 (2019)

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි
[ ]

1. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය : [ ]

සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4 (අදාළ අංකය කොටුව තුල ලියන්න)

2. තනතුර :

| | |
|---|---|
| යාන්ත්‍රික අධිකාරී | |
| සැලසුම් ශිල්පී | |
| ඉහත තනතුරු 2 ම | |

3. අයදුම්කරුගේ නම :

3.1 මුලකුරු සමග නම :
I. සිංහලෙන් / දෙමළෙන් :————.

II. ඉංග්‍රීසියෙන් (IN BLOCK LETTERS) :————.
උදා. :- (SILVA, A. B. C. D.)

3.2 මුලකුරුවලින් හැඳින්වෙන නම් :
I. සිංහලෙන් / දෙමළෙන් :————.

II. ඉංග්‍රීසියෙන් (IN BLOCK LETTERS) :————.

4. විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :
I. සිංහලෙන් / දෙමළෙන් :————.

II. ඉංග්‍රීසියෙන් (IN BLOCK LETTERS) :————.

5. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

6. ස්ත්‍රී / පුරුෂ භාවය : පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ස්ත්‍රී - 1 [ ]

7. ලිපිනය :
I. පෞද්ගලික ලිපිනය :————.

II. දිස්ත්‍රික්කය :————.

8. ජංගම දුරකථන අංකය : | | | | | | | | | | |

9. උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

10. විවාහක / අවිවාහක බව :————.

11. පුරවැසිභාවය : පරම්පරාවෙන්/ලියාපදිංචියෙන් :————.

12. අධ්‍යාපන සුදුසුකම් :
I. අ. පො. ස. (සා/පෙළ) විභාගය :

විභාග අංකය :————. වර්ෂය :————. මාධ්‍යය :————.

| *සමත් වූ විෂයයන්* | *ශ්‍රේණිය* | *සමත් වූ විෂයයන්* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| (1) | | (6) | |
| (2) | | (7) | |
| (3) | | (8) | |
| (4) | | (9) | |
| (5) | | (10) | |

II. අ. පො. ස. (උ/පෙළ) විභාගය :

විභාග අංකය :————. වර්ෂය :————. මාධ්‍යය :————.

| *සමත් වූ විෂයයන්* | *ශ්‍රේණිය* |
|---|---|
| (1) | |
| (2) | |
| (3) | |
| (4) | |

13. වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :

| අනු අංකය | පාඨමාලාවේ නම | ආයතනය | කාල සීමාව | ප්‍රතිඵල |
|---|---|---|---|---|
| 01. | | | | |
| 02. | | | | |
| 03 | | | | |

14. දැනට කිසියම් තනතුරක් දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර :
I. තනතුර හා ශ්‍රේණිය :————.
II. පත් වූ දිනය :————.
III. ආයතනය :————.
IV. විශ්‍රාම වැටුප් සහිත තනතුරක් ද යන වග :————.

*අයදුම්කරුගේ ප්‍රකාශය :*

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගැනීමට ලැබුණහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත් කිරීමෙන් පසු අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කල හැකි බවත් මා දනිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

15. විභාග ගාස්තුව ගෙවීම පිළිබඳ විස්තර :
15.1 ගෙවා ඇති විභාග ගාස්තුව රුපියල් (අකුරින්) :————.
15.2 කුවිතාන්සි අංකය :————.
15.3 නිකුත් කල කාර්යාලය :————.
15.4 දිනය :————.

ලදුපත නොගැලවෙන සේ එහි එක් දාරයක් මෙහි අලවන්න.
මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ වෙත තබා ගන්න.

16. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*
මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති ........................... නැමති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ............ දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.
සහතික කරන්නාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
නිල මුද්‍රාව :————.

17. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ සේවකයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :
.......................... මහතා/මහත්මිය/මෙනෙවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවකයකු /සේවිකාවක ලෙස සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
හා නිල මුද්‍රාව

දිනය :————.

05-857

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයට අයත් උපදේශක තනතුරෙහි III ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයට අයත් උපදේශක තනතුරේ III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. මෙම විභාගය මගින් බඳවා ගැනීම් සිදු කරනුයේ උපදේශක III ශ්‍රේණිය සඳහා වේ.

*ලිඛිත විභාගය* - මෙම විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙක (02) කින් සමන්විත වේ. :

1. සාමාන්‍ය දැනීම
2. බුද්ධි පරීක්ෂණය

02. පත්කරනු ලබන අයගේ සංඛ්‍යාව 10 කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසන් පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 80 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

03. *සේවා කොන්දේසි :*

3.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක : PSC/EST/04-01-43/02/2016 හා 2017.09.12 දිනැතිව අනුමත ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පරිපාටියෙහි ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම පරිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 1589/30 හා 2009.02.20 දින දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලට ද, යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයෙකු මෙම සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

3.2 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

3.3 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ උපදේශක III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

3.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 01/2014 ට අනුව හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

3.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත්කරන ලද තනතුරක හෝ පත්කරන ලද ප්‍රදේශයක රාජකාරී භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මග හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට දුම්රිය සාමාන්‍යාධිකාරී වරයාට බලය ඇත.

04. *මාසික වැටුප් පරිමාණය :*
2016.02.25 දිනැති 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාල වැටුප් පරිමාණය රු. 31,040- 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 57,550- (MN-3-2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින්කලට ගෙවනු ලබන වෙනත් දීමනාද ඔබට හිමි වේ.

05. *බඳවා ගැනීමේ සුදුසුකම් :*

(අ) (i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම;
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත වීම;
(iii) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ආ) අධ්‍යාපන සුදුසුකම් :
සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

සහ

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම. (පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

(ඇ) *වෘත්තීය සුදුසුකම් :*
ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව හෝ උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව හෝ තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතාවය (N.V.Q) පහ

(05) හෝ හය (06) මට්ටමේ යාන්ත්‍රික, විදුලි හෝ මෙකාට්‍රොනික් ක්ෂේත්‍රයේ පිළිගත් තාක්ෂණික මට්ටමේ පාඨමාලාවක් හදාරා තිබීම.

(ඈ) *පළපුරුද්ද* :
අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් කාර්මික ආයතනයක වසර දෙකක ඉගැන්වීමේ සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත දක්වා ඇති සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(ඉ) *වයස* : අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු
උපරිම සීමාව : අවුරුදු 45 ට නොවැඩි

06. *බඳවා ගැනීමේ ක්‍රමය* :

06.1 ලිඛිත විභාගය :

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. එක් එක් විෂයය සමත් වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ. :-

| *විෂයය* | *ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය* | *කාලය* |
|---|---|---|---|
| 01. සාමාන්‍ය දැනීම | 100 | 40 | පැය 01 |
| 02. බුද්ධි පරීක්ෂණය | 100 | 40 | පැය 01 |

අපේක්ෂකයන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතුය.

6.1.1 **ලිඛිත විභාගයේ විෂය නිර්දේශය** :

01. සාමාන්‍ය දැනීම-
ආර්ථික, සමාජීය, දේශපාලනික, භූගෝලීය හා විද්‍යාත්මක කරුණු පිළිබඳව දේශීය හා ජාත්‍යන්තර මට්ටමෙන් අපේක්ෂකයා තුල ඇති දැනුම පිරික්සීම සඳහා සැකසූ ප්‍රශ්න පත්‍රයකි.

02. බුද්ධි පරීක්ෂණය-
තර්කන ශක්තිය, තීරණ ගැනීමේ හැකියාව සහ ගණිතමය කුසලතාවය පරීක්ෂා කරනු ලැබේ.

06.2 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

මෙම නිවේදනයේ 6.1 ඡේදය අනුව ලිඛිත තරග විභාගයට පෙනී සිට සමත් වන අයදුම්කරුවන්ගෙන් ඉහළම කුසලතා දක්වූ අයදුම්කරුවන් පවතින පුරප්පාඩු සංඛ්‍යාවේ දෙගුණයකට සමාන සංඛ්‍යාවක් තෝරා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කරනු ඇත. පොරොත්තු ලේඛනවල තබා බඳවා ගැනීමක් සිදු කරනු නොලැබේ.

දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු සීයය (100) කි.

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු* |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 |
| පළපුරුද්ද | 40 |
| ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය හා පරිගණක හැකියාව | 10 |
| සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වනු ලබන කුසලතාවය | 05 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 10 |
| වෘත්තීය පරීක්ෂණය | 25 |
| මුළු ලකුණු | 100 |

06.3 එහි විස්තරාත්මක ලකුණු ලබාදීමේ පරිපාටිය පහත පරිදි වේ. :-

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *සලකා බලන උප ක්ෂේත්‍රයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | ඩිප්ලෝමා/උපාධිය/පශ්චාත් උපාධිය/වෙනත් ආදිය | ලකුණු 10 |
| පළපුරුද්ද | අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් කාර්මික ආයතනයක වසර දෙකක ඉගැන්වීමේ සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්දට අමතරව ලබා ඇති ඉගැන්වීමේ සහ ප්‍රායෝගික පළපුරුද්ද සඳහා එක් වසරකට ලකුණු 05 බැගින් උපරිම වසර 08 ක් සඳහා | ලකුණු 40 |
| ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය හා පරිගණක හැකියාව | ඉංග්‍රීසි භාෂාව හැසිරවීමේ හැකියාව හා/හෝ ඉංග්‍රීසි භාෂා පාඨමාලා ලකුණු 05<br>හදාරා ඇති පරිගණක පාඨමාලා අනුව උපරිම ලකුණු 05 ක් දක්වා | ලකුණු 10 |
| සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වනු ලබන කුසලතාවය | පෞර්ෂය සහ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින ආකාරය | ලකුණු 05 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | වෘත්තීයට අදාලව හදාරා ඇති අතිරේක වෘත්තීය පාඨමාලා සහ පුහුණුවීම් | ලකුණු 10 |

දේශන පැවැත්වීමේ කුසලතාවය පරීක්ෂා කිරීම සඳහා පැවැත්වෙන වෘත්තීය පරීක්ෂණය :

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | ලබා දෙන ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. දේශන සටහන් පිළියෙල කිරීම | ලකුණු 07 | 10 |
| 2. ඉදිරිපත් කිරීම | ලකුණු 18 | |
| i. පිවිසුම | ලකුණු 03 | |
| ii. දේශන සැලැස්මේ කරුණු සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම | ලකුණු 03 | |
| iii. ඉදිරිපත් කිරීමේ විලාශය | ලකුණු 05 | |
| iv. විෂයය අන්තර්ගතය | ලකුණු 04 | |
| v. කාල කළමනාකරණය | ලකුණු 03 | |

**සැලකිය යුතුයි.**-සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගීවීම, පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

06.4 විභාගය සමත් සියලු අයදුම්කරුවන්ගේ නාම ලේඛනය දුම්රිය දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කරනු ලැබේ.

07. *විභාග ගාස්තු :*

විභාග ගාස්තුව රු. 1000 කි. එය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට දුම්රිය සාමාන්‍යාධිකාරීගේ මහජන බැංකු නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176-100129027-313 ට බැර වෙන පරිදි ඕනෑම මහජන බැංකු ශාඛාවක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මඟින් අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

08. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූළ විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත භාවිත කරමින් ඒ4 (A4) ප්‍රමාණයේ කඩදාසියක, අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 2.12 තෙක් පළමුවන පිටුවටද, 3.0 සිට 5.0 තෙක් දෙවන පිටුවටද 6.0 සිට 7.0 තෙක් ශීර්ෂ එහි තෙවන පිටුවට ද ඇතුලත් වන සේ තම අයදුම්පත්‍රය සකස්කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද හෝ යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකිය.

(ආ) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කරන මාධ්‍යයෙන් තම අත් අකුරෙන්ම විභාග අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. එසේම නිවේදනයේ ඇතුලත් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ

සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න හා සියළු තොරතුරු ඇතුලත් කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුලත් කොට ලදුපත අලවා තිබේද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් විය යුතුය. තවද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

(ඈ) නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2019.06.30 දිනට පෙර එවිය යුතුය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ, වමත් පස ඉහළ කෙළවරේ පැහැදිලිව ''ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ උපදේශක III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2019'' යනුවෙන් ලිවිය යුතුය. එදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ.

දුම්රිය සාමාන්‍යාධිකාරී,
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 355, ඕල්කොට් මාවත, කොළඹ 10.

(ඇ) අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කල තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(ඊ) අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුනි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ පත්වීම් ශාඛාව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී අයදුම්කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් එම විස්තරය සමඟ ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් එම නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය මගින් දුම්රිය දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී දුම්රිය දෙපාර්මේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.

09. විභාගයට ඇතුළත්වීම :

(අ) ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන්ට දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අයදුම්කරුවන් තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවා ගෙන පළමුවෙන් එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. සෑම අයදුම්කරුවෙකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති උල්ලංඝනය කළහොත් දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(ඇ) අත්සන සහතික කිරීම. ''අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය.

**සටහන.**-අයදුම්කරුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10. *අයදුම්කරුගේ අනන්‍යතාව* :

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍රවලින් එකක් හෝ ඉදිරිපත් කළ යුතු ය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
(ආ) වලංගු විදේශ ගමන්බලපත්‍රය.

11. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* :
අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බවට අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අතරතුර

දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි ය.

12. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

13. *විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය* :

(අ) විභාගය සිංහල සහ දෙමළ යන භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

සටහන : (1) අයදුම්කරුවකු විභාගයේ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකටම එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.

(2) තම අයදුම්පත්‍රයෙහි සඳහන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට අයදුම්කරුවකුට අවසර දෙනු නොලැබේ.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේනම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එම්. ජේ. ඩී. ප්‍රනාන්දු,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2019 මැයි මස 15 වැනි දින දී,
තැ.පෙ. 355,
ඕල්කොට් මාවත,
කොළඹ 10
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දී.

ආදර්ශ අයදුම්පත

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයට අයත් උපදේශක තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019**

1.0 මාධ්‍යය :
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 1
දෙමළ - 2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.) අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

2.0 පෞද්ගලික තොරතුරු :

2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

2.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :
(උදා. : GUNAWARDHANA, H. M. S. K.)

2.3 සම්පූර්ණ නම : (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල්කරනු ලැබේ.) :

2.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.6 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0 ස්ත්‍රී - 1 අදාළ අංකය කොටුව තුළ ලියන්න.

2.7 ජාතික හැඳුනුම්පත් අංකය :

2.8 විවාහක/අවිවාහක බව : අදාළ අංකය කොටුව තුළ ලියන්න.
අවිවාහක - 1
විවාහක - 2

2.9 ජනවර්ගය (සිංහල - 1, දෙමළ - 2, ඉන්දියන් දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

2.10 උපන් දිනය වර්ෂය මාසය දිනය

2.11 සුදුසුකම් සැපිරිය යුතු 2019.06.30 දිනට වයස :

අවුරුදු මාස දින

2.12 දුරකථන අංකය :

3.0 සුදුසුකම් :

3.1 අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සා.පෙළ) වර්ෂය :————. විභාග අංකය :————.

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 01. | | |
| 02. | | |
| 03. | | |
| 04. | | |
| 05. | | |
| 06. | | |
| 07. | | |
| 08. | | |
| 09. | | |
| 10. | | |

අ.පො.ස.(උ/පෙළ) විභාගය

වර්ෂය :————. විභාග අංකය :————.

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 01. | | |
| 02. | | |
| 03. | | |
| 04. | | |

3.2 වෘත්තීය සුදුසුකම් :

..........................................................................................................

..........................................................................................................

3.3 පළපුරුද්ද :

..........................................................................................................

..........................................................................................................

4.0 විභාග ගාස්තු ගෙවීම :

විභාග ගාස්තු :————.

(i) ගෙවන ලද මහජන බැංකු ශාඛාව :————.

(ii) ගෙවූ මුදල :————. (iii) ගෙවූ දිනය :————.

| |
|---|
| ලදුපත එහි දරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ පිටපතක් ළග තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) |

5.0 අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද මුදල් තැන්පතු පත්‍රිකාව මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග නීති රීති වලට එකගව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුලත් සේවා ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකග වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (ගැසට් නිවේදනයේ 8 (ඈ) පරිදි විය යුතුය) :

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ........................... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත මෙහි අලවා ඇති බවත්, .................. දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුය.)

7.0 ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ..................... මයා/මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ............... ලෙස සේවය කරන අතර ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකිය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
දිනය :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුය.)

05-849

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2018 (2019)

### ව්‍යවස්ථාව හා නිර්දේශ පත්‍රය

කතෝලික යොවුන් දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය ලෙස හඳුන්වනු ලබන මෙම විභාගය 2019 සැප්තැම්බර් මාසය තුළ පැවැත්වීමට කටයුතු යොදා ඇත.

02. *විභාග මධ්‍යස්ථානය*.- දිවයින තුළ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන ලෙස අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ඇත. එහෙත් යම් මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවලදී එකී විභාග මධ්‍යස්ථාන අවලංගුකොට අදාළ අයදුම්කරුවන් ඊට ආසන්නව පිහිටි විභාග මධ්‍යස්ථාන වෙත යොමු කිරීමට සිදුවනු ඇත. විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලබන දිස්ත්‍රික්ක හා නගර දැක්වෙන ලැයිස්තුව I වන උපලේඛනයේ දක්වා ඇත.

03. *භාෂා මාධ්‍යය*.-මෙම විභාගය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ.

04. *සුදුසුකම්*.– මෙම විභාගය සඳහා ඉල්ලුම්කරන සෑම අයදුම්කරුවකුම පහත දක්වා ඇති සුදුසුකම් අතුරින් යටත් පිරිසෙයින් කවර හෝ එක් සුදුසුකමක් සපුරා තිබිය යුතුය.

4.1 කතෝලික දහම් පාසලක 10 වැනි ශ්‍රේණිය සමත් වී දහම් පාසල් අවසාන සහතික පත්‍ර පන්තියේ යටත් පිරිසෙයින් වර්ෂයක් හෝ ඉගෙනුම් කටයුතුවල නිරතවීම;

4.2 ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ කතෝලික ධර්මය (ක්‍රිස්තු ධර්මය රෝ. ක.) විෂයයෙන් සමත්ව සිටීම හෝ ජොෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් කතෝලික ධර්මය (ක්‍රිස්තු ධර්මය රෝ. ක.) විෂයයෙන් සමත්ව සිටීම;

4.3 ඒ ඒ රදගුරුවසම්වල පවත්වන වාර්ෂික ධර්මෝපදේශ විභාගයේ එකොළොස්වන වසර සමත්වීම.

*සටහන* :– I මෙම විභාගය සඳහා ඉදිරිපත්වන සෑම අයදුම්කරුවකුම ඉහත 4 වැනි ඡේදයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති බවට දහම් පාසල් ප්‍රධානාචාර්යවරයකු හෝ මීසම්භාර පූජාප්‍රසාදිතුමකු හෝ විසින් සහතික කළ යුතුය.

II විභාග අපේක්ෂකයන්ට මෙම විභාගය සඳහා ඉදිරිපත් විය හැක්කේ දහම් පාසල් අයදුම්කරුවකු වශයෙන් පමණකි.

05. *අයදුම් කිරීම* :

5.1 කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය සඳහා විභාග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ සියලු ම දහම් පාසල්වලට අවශ්‍ය අයදුම්පත්‍ර සහ උපදෙස් පත්‍රිකා යථා කාලයේ දී සපයනු ලැබේ. නියමිත දින වකවානු තුළ අයදුම්පත් නොලැබුණහොත්, දහම් පාසලේ නම, ලිපිනය, ඉදිරිපත් කරන අයදුම්කරුවන් සංඛ්‍යාව යන විස්තර සඳහන් ලිපියක් 5.6 ඡේදයේ සඳහන් ලිපිනයට 2019.06.14 වැනි දිනට පෙර දැන්විය යුතු ය.

5.2 කවර හෝ අයදුම්කරුවකුට බාහිර අයදුම්කරුවකු වශයෙන් විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. එසේ වුවත් 4 වැනි ඡේදයේ සුදුසුකම් සපුරා ඇති යම් විභාග අයදුම්කරුවකු වේ නම් තමන් පදිංචි ස්ථානයට ආසන්න දහම් පාසල මගින් රුපියල් 200ක විභාග ගාස්තුවක් ගෙවා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා අවශ්‍ය උපදෙස් සියලුම දහම් පාසල් ප්‍රධානීන් වෙත ලබාදෙනු ඇත.

5.3 අදාළ දහම් පාසල් ප්‍රධානීන් විසින්ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් පිටපත් දෙකකින් යුක්තව සකස් කර මුල් පිටපත විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු අතර දෙවන පිටපත ප්‍රධානාචාර්යවරයා වෙත තබා ගත යුතුය. අයදුම්පත්‍ර දෙකෙහිම ප්‍රධානාචාර්යවරයා අත්සන් කර තිබිය යුතුය.

5.4 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2019.06.28 වැනි දින වේ.

5.5 අයදුම්පත් පැහැදිලිව ද නිවැරදිව ද සම්පූර්ණ කළ යුතුය. එසේ නොවන අයැදුම්පත් සහ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.6 දහම් පාසලේ පරිගණක අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු අතර, **ලිපිනය වෙනස් වී නම් එය දැන්විය යුතු ය. දුරකථන පහසුකම් ඇත්නම් එම අංකය ද සඳහන් කරන්න.** සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ. :

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.
තැ. පෙ. 1503,
කොළඹ.

අයදුම්පත් බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය -

2019" යනුවෙන් ද ඉල්ලුම් කරන නගරය ද සඳහන් කළ යුතු ය.

කිසිම සහතිකයක් අයදුම්පත් සමග අමුණා එවීම අවශ්‍ය නොවේ.

5.7 අයැදුම්කරුවන්ගේ අදාළ සහතික පිළිබඳවත්, සුදුසුකම් ලබා තිබීම පිළිබඳවත්, අයදුම්පත් සහතික කරන විදුහල්පතිවරයා හෝ පූජාප්‍රසාදීතුමා හෝ වගකිව යුතුය.

5.8 විභාගයට ඉදිරිපත් කරන සියලුම අයැදුම්කරුවන් විසින් අයදුම්පතේ සඳහන් සම්පූර්ණ කර ඇති තොරතුරු පෞද්ගලිකවම පරීක්ෂාකර බලා අත්සන් කළ යුතුය.

5.9 අයදුම්කරුවන්ගේ අත්සන් යොදා නැති, මකන දියර භාවිත කරන ලද හා වෙනත් අඩුපාඩුකම් සහිත අයදුම් පත්‍ර මෙන්ම අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. *විභාග ගාස්තු.*– මෙම විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව රු. 200 කි. එහෙත් ප්‍රථම වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් මෙම විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ. ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කිරීම සඳහා වන විෂයයට විභාග ගාස්තු රු. 50 කි.

6.1 *විභාග ගාස්තු ගෙවීම.*– විදුහල්පතිතුමා විසින් ගාස්තු ගෙවිය යුතු සියලුම අයදුම්කරුවන්ගේ විභාග ගාස්තු එකතු කොට දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකට එම සම්පූර්ණ මුදල ගෙවා ලදුපතක් ලබාගෙන එම ලදුපත අයදුම්පත්‍රයේ පසු පිටේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. **(මුද්දර හා මුදල් ඇණවුම් භාරගනු නොලැබේ)**

6.2 *විභාග ගාස්තු ආපසු ගෙවීම.*– කුමන කරුණක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවන ගාස්තු වෙනත් විභාගයකට මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් හෝ සිදු කරනු නොලැබේ.

07. *ප්‍රවේශ පත්‍ර.*– විභාගයට ඇතුළත් කර ගන්නා සෑම අයදුම්කරුවකු වෙතම, විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක්, ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා මගින් නිකුත් කරනු ඇත.

7.1 විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු විසින් ස්වකීය ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගෙන විභාග යට පෙනී සිටින ප්‍රථම අවස්ථාවේදී ම විභාග ශාලාධිපති වෙත භාරදිය යුතුය. යම් අයදුම්කරුවකු තම ප්‍රවේශ පත්‍රය භාර නොදී සිටී නම් හා විභාග කොමසාරිස් ජනරාල් විසින් තමාට නියම කරන විභාග මධ්‍යස්ථානය හැර වෙනත් විභාග මධ්‍යස්ථානයක දී විභාගයට පෙනී සිටී නම් ඔහුගේ හෝ ඇයගේ හෝ විභාග අපේක්ෂකත්වය අහෝසි කරනු ඇත.

7.2 ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන, දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා හෝ මීසම් භාර පූජාප්‍රසාදීතුමා හෝ රජයේ විද්‍යාලයාධිපතිවරයෙකු හෝ රජයේ ස්ථිර සේවයේ නියුතු මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කළ යුතුය.

7.3 විභාගය පැවැත්වීමට දින 07 කට පෙර ප්‍රවේශ පත්‍ර නොලැබුණහොත් එම දහම් පාසලේ ප්‍රධානියා විසින් ඒ බව නොපමාව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැන්විය යුතුය. එවැනි සෑම අවස්ථාවකම පහත සඳහන් විස්තර සැපයිය යුතුය;

1. විභාගයේ නම :——————————;
2. දහම් පාසලේ නම :————————;
3. දහම් පාසලට ලබාදී ඇති පරිගණක අංකය :———;
4. අයදුම්කරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය :———;
5. ඉල්ලුම් කළ විභාග මධ්‍යස්ථානය/නගරය :———;
6. ඉල්ලුම් පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලය :———;
7. ලිපිය ලියාපදිංචි කළ අංකය සහ දිනය :————;
8. විභාග ගාස්තු ගෙවා ඇත්නම් එම ලදුපත් අංකය, දිනය සහ තැපැල් කාර්යාලය :——————;

08. *අනන්‍යතාව.*- එක් එක් ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින සෑම අවස්ථාවකම *විභාග* ශාලාධිපති වෙත අපේක්ෂකයන් විසින් තමන්ගේ අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා සූදානම් ව සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය. :

8.1 ජාතික හැඳුනුම්පත;
8.2 වලංගු විදේශ ගමන් බලපත්‍රය;
8.3 වලංගු රියදුරු බලපත්‍රය;
8.4 තැපැල් හැඳුනුම්පත.

09. *සමත් බව තීරණය කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම* :

මෙම විභාගය සඳහා නියමිත විෂයය ගණන හතරක් වන අතර, විභාගයෙන් සාමර්ථ්‍යය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයකුම එම විෂයය හතරෙන්ම සමත් විය යුතුය. කෙසේ වෙතත් එක් වතාවක දී අදාළ විෂයය හතරෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් එය ඌන සාමාර්ථයක් ලෙස සලකනු ලැබේ. විභාගයට පෙනී සිටි වර්ෂයේ සිට අනුගාමී ඉදිරි වර්ෂ දෙක (02) ඇතුළත දී එම ඌන සාමාර්ථය ලැබූ විෂයය සඳහා නැවත පෙනී සිට එය සමත් වී ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කළ යුතුය. **ඌන සාමාර්ථ්‍යය ලබන සිසුන් ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කිරීමේ දී විභාගයට**

**පෙනී සිටිය යුත්තේ අනිවාර්යයෙන්ම ඌන සාමාර්ථ්‍යය ලැබූ විෂයයට පමණි.**

9.1 සෑම විෂයයකම එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100ක් හිමිවන අතර, සමත්වීමේ ශ්‍රේණිවලට අදාළ ලකුණු පරාස සහ සංකේත පහත දැක්වේ :-

| *ලකුණු පරාසය* | *ශ්‍රේණිය* | *සංකේතය* |
|---|---|---|
| 0-34 | අසමත් | F |
| 35-54 | සමත් | S |
| 55-69 | සම්මාන | C |
| 70-100 | විශිෂ්ට සම්මාන | D |

9.2 අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තුව අදාළ දහම් පාසල් ප්‍රධානීන් වෙත තැපැල් මගින් එවනු ලැබේ.

10. *සහතික පත්‍ර.*-මෙම විභාගයෙන් සමත්වන සෑම අයදුම්කරුවකුට ම විභාග දෙපාර්තමේන්තුව මගින් සහතික පත්‍රයක් නිකුත් කිරීමට විධිවිධාන යොදනු ලැබේ.

11. *උත්තරපත්‍ර නැවත සමීක්ෂණය.*-දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන්ගේ ඉල්ලීම මත පමණක් උත්තර පත්‍ර නැවත සමීක්ෂණයට ඉඩදෙනු ලැබේ. මෙම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින්, විභාගයේ ප්‍රතිඵල නිකුත් වී දින 30ක් ඇතුළත නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය. මේ සඳහාවන ගාස්තු ප්‍රමාණයන් වරින්වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින් එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. මෙම ගාස්තු ආපසු ගෙවනු ලබන්නේ මුලින්ම දෙන ලද ප්‍රතිඵලයක වෙනසක් කිරීමට සිදුවුවහොත් පමණි. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ උත්තර පත්‍ර පරීක්ෂා කිරීමට ඉඩදෙනු නොලැබේ.

12. මෙම ව්‍යවස්ථාව සහ විෂය නිර්දේශ පත්‍රයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියාකිරීමට සියලුම විභාග අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි විධිවිධාන සලසා නැති කවර හෝ යම් කරුණක් වෙතොත් එය විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ අභිමතය පරිදි තීරණය වනු ඇත.

බී. සනත් පූජිත,
විභාග කොමසාරිස් ජනරාල්.

2019 මැයි මස 10 වැනි දින,
පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේදී ය.

**කතෝලික ධර්මය**

(2007 සිට ඉදිරියට පැවැත්වෙන විභාග සඳහා විෂයය නිර්දේශය)

මෙම විභාගය පැය 03 බැගින් වූ ප්‍රශ්න පත්‍ර 04කින් සමන්විත ය.

I වැනි ප්‍රශ්න පත්‍රය

**කතෝලික විශ්වාසය**

(*අ*) මෙම ප්‍රශ්න පත්‍රය සඳහා අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණයේ එන මූලික ඉගැන්වීම් පදනම් වේ.

* මැවුම්කරුවාණෝ
- විශ්වයේ ප්‍රභවය
- මැවිල්ලේ අසිරිය
- මැවිල්ල සුරැකීම (උත්පත්ති 1, 2, 3)

* ගැලවුම්කරුවාණෝ
- ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ (ජොහන් 1 : 1-14)
- දේව රාජ්‍ය පිළිබඳ ඉගැන්වීම් (මතෙවු 5, 6, 7)
- උපමා (මතෙවු 13:1-52)
- ප්‍රාතිහාර්ය (ජොහන් 11:38-45, ලූක් 8:26-39, මාක් 2:1-12, මාක් 4:35-41)

* ශුද්ධාත්මයාණෝ
- ක්‍රියාකාරිත්වය (ජොහාන් 7:37-39, 14:15-31, 16:5-15, 1 කොරින්ති 12:4-11)

* කිතුනු සභාව
- ඒකත්වය, ශුද්ධත්වය, සාධාරණත්වය සහ අපෝස්තලිකත්වය
- සභාව ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය ලෙස
  - * රෝම 12:4-21
  - * 1 කොරින්ති 12:12-31
- සභාවේ පාලන සැලැස්ම
- නිල බලය ලත් සේවය
- පැවිදි සේවාවන්
- ගිහි සේවාවන්

* රූපාන්තර පරිවර්තනය
- මනුෂ්‍යයාගේ අවසාන සිද්ධි
- අලුත් අහසක්, අලුත් පොළොවක් (එළිදරව්ව 21:1-4)

II වැනි ප්‍රශ්න පත්‍රය

**කතෝලික ජීවිත පැවැත්ම**

(*ආ*) කතෝලික ජීවිත පැවැත්මට පන්නරය ලැබෙන ජනවන්දනාව

* දිව්‍ය පූජාව සහ පූජා පිළිවෙත

* පාස්කු අභිරහස
* දේව වරප්‍රසාද
* ප්‍රසාද නිධාන (පොදු ලක්ෂණ)

❍ ආරම්භ ප්‍රසාද නිධාන
  * ප්‍රසාද ස්නාපනය
  * අභිවෘද්ධි ආලේපය
  * දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ

❍ සුවය ලබාගැනීමේ ප්‍රසාද නිධාන
  * සමගි සන්ධානය
  * රෝගීන්ගේ ආලේපය

❍ සේවය සඳහා ස්ථාපිත ප්‍රසාද නිධාන
  * පූජකවරය
  * ආශිර්වාදකාර බන්ධනය

III වැනි ප්‍රශ්න පත්‍රය

**කතෝලික සදාචාරාත්මක ජීවිතය**

(ඉ) කතෝලික සදාචාරය
  * දස පනත සහ ප්‍රේමයේ පනතේ පැතිකඩ දෙක
  * දස පනත පූර්ණත්වයට පත් කළ ක්‍රිස්තුන් වහන්සේ (මතෙව් 5:21-47)
  * තැනිතලා ස්ථානයේ දේශනය (ලූක් 6:17-49)
  * බුද්ධිය, නිදහස් කැමැත්ත සහ හැඟීම්
  * දේව සම්බන්ධ ධර්ම ගුණ
  * හෘද සාක්ෂිය
  * දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම (1-3 පනත්)
  * අසල්වැසියාට ප්‍රේම කිරීම (4-10 පනත්)
  * දස පනත තුළින් මතුවිය යුතු සාරධර්ම
  * කතෝලික අනන්‍යතාව

IV වැනි ප්‍රශ්න පත්‍රය

**යාච්ඤාවේ ජීවිතය**

(ඊ) දේව සබඳතා ගොඩනැගෙන යාච්ඤාව

* පුරාණ ගිවිසුමේ යාච්ඤාව
  - අබ්‍රහම්
  - මෝසෙස්

* නව ගිවිසුමේ යාච්ඤාව
  - ක්‍රිස්තුන් වහන්සේ යාච්ඤා කළ විශේෂ අවස්ථා
  - යාච්ඤාව පිළිබඳ විශේෂ ඉගැන්වීම් (ලූක් 11:1-13)

* සභා ජීවිතය තුළ යාච්ඤාව
  - ප්‍රශංසාව
  - තුති පිදීම
  - යැදුම
  - මැදහත් යැදුම
  - භාවනාත්මක යාච්ඤාව

* ස්වාමිවාක් ආරාධනයේ ඉල්ලීම හත
  - ඔබගේ නාමයට ප්‍රශංසා වේවා
  - ඔබගේ රාජ්‍යය පැමිණේවා
  - ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් මෙලොවෙහි ඉටුවේවා
  - අපගේ එදිනෙදා භෝජනය අද අපට දානය කළ මැනව
  - අපට වැරදි කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන් අපගේ වැරදි ද කමා කළ මැනව
  - පාප අවස්ථාවන්ට අසුවීමට අපට ඉඩ නොදුන මැනව
  - අයහපතින් අප මුදා ගත මැනව.

* විවිධ භක්ති අභ්‍යාස
  - ජපමාලය
  - නුවාන
  - ශුද්ධ පැය

**පරිශීලනය කළ යුතු ග්‍රන්ථ**

- නව කතෝලික ධර්මෝපදේශය
- මහෝපදේශය
- ශුද්ධ බයිබලය (නියමිත කොටස්)
- II වන වතිකාන ප්‍රකාශන

* ජනවන්දනාව
* වර්තමාන ලෝකයේ ශුද්ධ සභාව
* ක්‍රිස්තුන් වහන්සේගේ සභාව
* ගිහි ධර්මදූත සේවය

1. උපලේඛනය

ඒ ඒ දිස්ත්‍රික්කයන්හි විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර සහ නගර අංක

**දිස්ත්‍රික්කය 01 - කොළඹ**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| බොරැල්ල | 0101 |
| කලුඅග්ගල | 0102 |
| පන්නිපිටිය | 0103 |
| මොරටුව | 0104 |

**දිස්ත්‍රික්කය 02 - ගම්පහ**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| මීගමුව | 0205 |
| කඳාන | 0206 |
| ගම්පහ | 0207 |
| රාගම | 0208 |

**දිස්ත්‍රික්කය 03 - කළුතර**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කළුතර | 0309 |

**දිස්ත්‍රික්කය 04 - ගාල්ල**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| ගාල්ල | 0410 |

**දිස්ත්‍රික්කය 05 - මාතර**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| මාතර | 0511 |

**දිස්ත්‍රික්කය 06 - හම්බන්තොට**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| හම්බන්තොට | 0612 |

**දිස්ත්‍රික්කය 07 - රත්නපුර**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| රත්නපුර | 0713 |

**දිස්ත්‍රික්කය 08 - කෑගල්ල**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කෑගල්ල | 0814 |

**දිස්ත්‍රික්කය 09 - පුත්තලම**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| පුත්තලම | 0915 |
| හලාවත | 0916 |
| වෙන්නප්පුව | 0917 |

**දිස්ත්‍රික්කය 10 - කුරුණෑගල**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කුරුණෑගල | 1018 |
| කුලියාපිටිය | 1019 |
| නිකවැරටිය | 1020 |

**දිස්ත්‍රික්කය 11 - මහනුවර**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| මහනුවර | 1121 |

**දිස්ත්‍රික්කය 12 - මාතලේ**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| මාතලේ | 1222 |

**දිස්ත්‍රික්කය 13 - නුවරඑළිය**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| තලවකැලේ | 1323 |

**දිස්ත්‍රික්කය 14 - බදුල්ල**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| බදුල්ල | 1424 |

**දිස්ත්‍රික්කය 15 - මොණරාගල**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| මොණරාගල | 1525 |

**දිස්ත්‍රික්කය 16 - අනුරාධපුරය**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| අනුරාධපුරය | 1626 |

**දිස්ත්‍රික්කය 17 - පොළොන්නරුව**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| හිඟුරක්ගොඩ | 1727 |

**දිස්ත්‍රික්කය 18 - ත්‍රිකුණාමලය**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| ත්‍රිකුණාමලය | 1828 |

**දිස්ත්‍රික්කය 19 - මඩකලපුව**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| මඩකලපුව | 1929 |

**දිස්ත්‍රික්කය 20 - අම්පාර**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| අම්පාර | 2030 |
| කල්මුනේ | 2031 |

**දිස්ත්‍රික්කය 21 - යාපනය**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| යාපනය | 2132 |
| මානිප්පායි | 2133 |
| පරුත්තිතුරෙ | 2134 |
| නෙඩුන්තිවු | 2135 |

**දිස්ත්‍රික්කය 22 - මුලතිව්**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කිලිනොච්චිය | 2236 |
| මුලතිව් | 2237 |
| මුලංගාවිල් | 2238 |

**දිස්ත්‍රික්කය 23 - මන්නාරම**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| මන්නාරම | 2339 |
| මුරුංගන් | 2340 |
| ආන්ඩාංකුලම් | 2341 |
| පෙරිය පන්ඩිවිරිස්සාන් | 2342 |

**දිස්ත්‍රික්කය 24 - වවුනියාව**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| වවුනියා | 2443 |

05-934

---

## සංවර්ධන නිලධාරි සේවයේ I කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015 (II) 2019

අංක 2,121 හා 2019.04.26 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද සංවර්ධන නිලධාරි සේවයේ I කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015 (II) 2019 විභාග නිවේදනයේ 5 ඡේදයේ සඳහන් කර ඇති අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2019.06.24 වැනි දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

02. මේවන විටත් අයදුම්කර ඇති අයදුම්කරුවන්හට නැවත අයදුම් කිරීමෙන් වලකින ලෙස දන්වනු ලැබේ.

03. එම *ගැසට් නිවේදනයේ* සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින් ම බලපැවැත්වේ.

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2019 මැයි මස 23 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා ආපද කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

05-973

---

## සංවර්ධන නිලධාරි සේවයේ II කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 (II) 2019

අංක 2,121 හා 2019.04.26 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළකරන ලද සංවර්ධන නිලධාරි සේවයේ II කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 (II) 2019 විභාග නිවේදනයේ 5 ඡේදයේ සඳහන් කර ඇති අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2019.06.24 වැනි දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

02. මේවන විටත් අයදුම්කර ඇති අයදුම්කරුවන්හට නැවත අයදුම් කිරීමෙන් වලකින ලෙස දන්වනු ලැබේ.

03. එම *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින්ම බලපැවැත්වේ.

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2019 මැයි මස 23 වන දින,
රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

05-974

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.